# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 18ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අවදානම් කළමනාකරු (HM 1-2)

### බාහිර අයදුම්කරුවන් (1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රක්ෂණය/ ගිණුම්කරණය/ ව්‍යාපාර පරිපාලන/ මූල්‍ය/ වාණිජ්‍යය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

   **සමඟ**

   අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13ක සේවා පළපුරුද්ද

   **හෝ**

2. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Full Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13ක සේවා පළපුරුද්ද

### අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 03ක කළමනාකරණ ශ්‍රේණියේ I ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම සහ එහි දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම. (පශ්චාත් උපාධියක් ලබා තිබීම)

**වැටුප් පරිමාණය** : HM 1-2 – 2016: රු. [81,670- 15 x 2,270 – 115,720]

**වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02.රක්ෂණ නිලධාරි (JM 1-1)

### බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3 හෝ 4 )

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් උපාධියක්/ පශ්චාත් උපාධියක් (MSc / MBA) ලබා තිබීම.

   **හෝ**

2. රක්ෂණය පිළිබඳ හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් හෝ පිළිගනු ලබන ආයතනයක් වෙතින් උසස් ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රය තුළ වසර 05ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

   **හෝ**

3. රක්ෂණය පිළිබඳ හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් හෝ පිළිගනු ලබන ආයතනයක් වෙතින් ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රය තුළ වසර 10ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

   **හෝ**

4. විෂය ක්ෂේත්‍රයට අදාළව වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ(තාක්ෂණික/ තාක්ෂණික නොවන මට්ටමේ) සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය** : JM 1-1 - 2016: රු. [42,600- 10 x 755 - 18 × 1,135 – 70,580]

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම්** : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

## කොන්දේසි :

**සියලුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරි, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2025.02.24 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**